සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- **පහත සඳහන් A, B, C, D, E කොටස් ඇසුරින් අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි.....

B මහලු වී සිටියත්
රුවින් අඩු වී සිටියත්
දුප්පත්ව සිටියත්
දෙමව්පිය වැඳ පුදනු යහපත්

C කැත්තක් අරගෙන වත්තට යනකොට
පෙත්තෙක් ඉදගෙන කජු කනවා.....

D "ඔබ වහන්සේගේ මළනුවන්ගේ කීමටයි මම මේ ආවේ
ඔබ වහන්සේගේ ගෙල කපලා මරන්න කීවේ ඔබ වහන්සේගේ මළණුවන්මයි."

E පුංචි අපේ කතන්දරේ
කුකුල් හාමි කෙනෙක් වෙතයි
මී හාමිලා හතර දෙනයි
වත්තේ මල් ගස් මෙඅපයි

01 හඬ අභ්‍යාස සඳහා ඔබ පංති කාමරයේ පුහුණු වූ රබන් පදය අයත් වන්නේ,
(i) C ය. (ii) B ය. (iii) A ය. (iv) E ය.

02 D කොටසෙහි දැක්වෙන සංවාදය අයත් ජනකතාව වන්නේ,
(i) නාඩි බැලීම. (ii) අනුන්ට කැපූවලේ තමන් වැටීම.
(iii) පුහුල් හොරා කරෙන් දැනේ. (iv) ගමරාළ දිව්‍යලෝකේ ගියා වගේ

03 නරියෙක්, ගමදුවක්, කැලෑවක් විස්තර වන නාට්‍යයකට අයත් ගීතය වන්නේ,
(i) B ය. (ii) A ය. (iii) C ය. (iv) E ය.

04 ඔබ නාට්‍යයක් නිර්මාණය කිරීමට පාදක කරගත් කවියකි,
(i) A ය. (ii) C ය. (iii) E ය. (iv) B ය.

05 E කොටසෙහි සඳහන් ගීතය අයත් ළමා නාට්‍ය වන්නේ,

(i) අමරගියා දිව්‍යලෝකෙ (ii) නෙලුම් කුමාරි

(iii) පුංචි අපට දැන් තේරෙයි. (iv) වළහා සහ මාෂා

- **ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

06 රිය අනතුරකදී දැකිය හැකි භාව ප්‍රකාශනයක් නොවේ.

(i) සතුට (ii) කුතුහලය (iii) පුදුමය (iv) ශෝකය

07 අධි මානුෂීය චරිතයක් නොවේ.

(i) දෙවියා (ii) යෝධයා (iii) සුරංගනාවිය (iv) හිඟන්නා

08 අනුශාංගික කලාවක් නොවේ.

(i) සංගීතය (ii) ආලෝකකරණය (iii) නළු නිළියන් (iv) රංග වස්ත්‍රාභරණ

09 සත්ව චරිතයක් අනුකරණය කිරීමේ දී සැළකිය යුතු කාරණයක් නොවේ.

(i) සතාගේ ප්‍රමාණය (ii) සතාගේ හැසිරීම

(iii) සතාගේ අලංකාරය (iv) සතාගේ හඬ

10 නාට්‍යයක් නැරඹීමෙන් ලබාගත නොහැකි.

(i) සතුට (ii) විනෝදය (iii) ආදර්ශය (iv) වෛරය

- **වඩාත් ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

( භූමිකාව, අශ්වකුර ගැටෙන, සංවේදන, සංවාද, නාට්‍යෝපකරණ )

11 රත් වූ යකඩයක් ඇල්ලීම .................................................................................................... අභ්‍යාසයකි.

12 .................................................................................................... යනු චරිතයක එක් පැතිකඩකි.

13 පොල්කටු දෙකක් එකිනෙක ගැටීමෙන් .................................................................... හඬ ලබාගත හැක.

14 .................................................................................................... නාට්‍ය පිටපතක අත්‍යවශ්‍ය අංගයකි.

15 රංගනයේදී යොදාගන්නා උපකරණ .................................................................................... නම් වේ.

- **හරි නම් (✓) ලකුණ ද , වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16 රංග ක්‍රීඩා යනු ක්‍රීඩකයින් පුහුණු කරන ක්‍රීඩාය. ( )

17 නාටයකට ගැටුම අත්‍යවශ්‍ය නොවේ. ( )

18 රංගනයේ දී සබකෝලය දුරු වේ. ( )

19 ස්වභාවික පරිසරය ඇසුරින් නාට්‍ය නිර්මාණය කළ හැක. ( )

20 පරිකල්පනය මෙහෙයවා නව නිර්මාණ බිහිකල හැක. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01 ගෝන්නු :- අවහල් කාරණයකටද මේ පස්ස ගිහි අරන් වගේ රේස් දුවන්නේ (සිහින් හඬින් විමසති.)

හාවෝ :- අර පැත්තේ අහස කඩා වැටෙනවළු. ඉක්මන් නොකළොත් අපි ඔක්කොම දාලා පිච්චිලා යාවි.
(හාවා, හා යහළුවන් හා ගෝන්නු ඉදිරියට දිවයති.)

මුවෝ :- මොකදෑ ..... මොකදෑ..... මේ මහා විපත්තියක් පාත් වෙලා වගේ .....

(i) මෙම සංවාද කණ්ඩය නිර්මාණය කිරීම සඳහා උපයෝගි කරගෙන ඇති කතන්දරය කුමක්ද? (ලකුණු 02)

(ii) මෙහි එන රංග විධානයක් ලියන්න. (ලකුණු 02)

(iii) මෙම කතන්දරය පංති කාමරයේ රඟ දැක්වීමේදී අනුකරණය කළ චරිත මොනවාද? (ලකුණු 02)

(iv) මෙම කතාවේ ගැටළුව විසැදීමට මුල් වූ චරිතය නම් කරන්න. (ලකුණු 02)

(v) මෙම කතන්දරයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ මොනවාද? (ලකුණු 02)

02 (i) නාට්‍ය යනු කුමක්ද? (ලකුණු 02)

(ii) ඔබ දන්නා වේදිකා නාට්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) කතන්දර හා නාට්‍ය අතර සමාන ලක්ෂණ දෙකක් හා අසමාන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 05)

03 (i) අනුකරණය යනු කුමක්ද? (ලකුණු 02)

(ii) ඔබ අනුකරණය කළ සත්ත්ව චරිතයක් සඳහා ගැලපෙන රංග වස්ත්‍ර හා ආභරණ ඇඳ දක්වන්න. (ලකුණු 03)

(iii) පහත වගුව සම්පූර්ණ කරන්න.

උදාː- වෛද්‍යවරයා - වෙද නලාව

| චරිතය | රංග භාණ්ඩය |
|---|---|
| මාළු වෙළෙන්දා | |
| හිඟන්නා | |
| ගොවියා | |
| රජතුමා | |
| විදුහල්පතිතුමා | |

(ලකුණු 05)

04 (i) ක්ෂණික නිරූපණයක් යනු කුමක්ද? (ලකුණු 02)

(ii) හඬ උත්පාදනය කිරීම සඳහා ඔබ නිර්මාණය කළ ආදේශන භාණ්ඩයක් නම් කර එය ඇඳ දක්වන්න. (ලකුණු 03)

(iii) ඔබ කියවා ඇති අධි මානුෂීය චරිත ඇතුළත් කතන්දරයක් කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

05 ඔබ දන්නා සුරංගනා කතාවක් ඇසුරින් නාට්‍ය පිටපතක් සකස් කරන්න.

- චරිත, සංවාද, රංග විධාන සහිත පෙළ නිර්මාණයට. (ලකුණු 06)
- ආදර්ශවත් නිමාව (ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( i ) 02. ( ii) 03. (ii ) 04. (iv) 05. (iii) 06. ( i ) 07. (iv) 08. (iii) 09. (iii) 10. (iv)

11. සංවේදන 12. භූමිකාව 13. අශ්වකුර ගැටෙන 14. සංවාද 15. නාට්‍යෝපකරණ

16. (X) 17. (X) 18. (✓) 19. (✓) 20. (✓)

## II කොටස

01 (i) අහස කඩා වැටීම. (ලකුණු 02)

(ii) (සිහින් හඬින් විමසති) (හාවා හා යහළුවන් හා ගෝන්නු ඉදිරියට දුවයති.) (ලකුණු 02)

(iii) ගෝන්නු, හාවෝ, මුවෝ, සිංහයෝ. (ලකුණු 02)

(iv) සිංහයා (ලකුණු 02)

(v) විමසා බලා කටයුතු කිරීම, අනුන් කියන දේ ඒ අයුරින් ම පිළි ගැනීමට පෙර ඒ පිළිබඳ සොයා බැලීම වැනි ඊට ගැලපෙන ආදර්ශයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

02 (i) නාට්‍ය යනු යමක් කර පෙන්වීමයි. (ලකුණු 02)

(ii) සිංහබාහු, මනමේ, අමර ගියා දිව්‍ය ලෝකෙ ..... (ලකුණු 03)

(iii) නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03 (i) කෙනෙක් කරන දෙයක් ඒ අයුරින්ම කර පෙන්වීම. (ලකුණු 02)

(ii) ගැලපෙන ලෙස ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

(iii)

| | | |
|---|---|---|
| මාළු වෙළෙන්දා | - | පිහිය |
| හිඟන්නා | - | කැටය, ටින් එක, බෙලෙක්කය |
| ගොවියා | - | උදැල්ල |
| රජතුමා | - | කඩුව |
| විදුහල්පතිතුමා | - | වේවැල |

(ලකුණු 05)

04 (i) පිටපතක් නොමැතිව, පෙර සූදානමක් නොමැතිව ඉදිරිපත් කරන නිරූපණයකි. (ලකුණු 02)

(ii) පොල්කටු දෙකක්, වැලි පිරවූ ටින් එකක්, ගස්ලබු බට නලාවක්, එක්ස්රේ කොළ වලින් සැකසූ රබානක්, ආදී ලෙස නම් කර ය ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

(iii) අධි මානුෂීය චරිතයක් සහිත කතාන්දරයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)